# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 61 දරන මහා භාරකාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 61 දරන මහා භාරකාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 16/86

මහා භාරකාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 61 දරන මහා භාරකාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, මහා භාරකාර ආඥාපනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— *88 වන අධිකාරයේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

"නියෝජ්‍ය මහා භාරකාරවරයා පත් කිරීම හා ඔහුගේ බලතල.

4. (1) මහා භාරකාරවරයාට සහාය වීම පිණිස නියෝජ්‍ය මහා භාරකාරවරයකු හෝ නියෝජ්‍ය මහා භාරකාරවරයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (යම් නියෝජ්‍ය මහා භාරකාරවරයකුගේ පත්වීම් ලිපියෙහි, ඔහු නියෝජ්‍ය මහා භාරකාරවරයා වශයෙන් පත් කරනු ලැබුවේ මුළු ශ්‍රී ලංකාව සඳහා ද නැතහොත් එහි යම් කොටසක් සඳහා ද යන වග නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.) එවැනි නියෝජ්‍ය මහා භාරකාරවරයකු පත් කරනු ලබන්නේ යම් ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශය මෙහි මින් මතු "ඔහුගේ පත්වීමේ ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන යම් නියෝජ්‍ය මහා භාරකාරවරයකුට මහා භාරකාරවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ නියමයන්ට යටත් ව, ඔහුගේ පත්වීමේ ප්‍රදේශය ඇතුළත මහා භාරකාරවරයා සතු කාර්ය අතුරින් කවර හෝ කාර්යයක් ඉටු කිරීමට හා බලතල අතුරින් කවර හෝ බලයක් ක්‍රියාත්මක කිරීමට බලය තිබිය යුතු ය. තවද ඔහු විසින් ඒ කාර්ය ඉටු කිරීමේ දී හෝ ඒ බලතල ක්‍රියාත්මක කිරීමේ දී මහා භාරකාරවරයා සතු වරප්‍රසාදම ඔහුට තිබිය යුතු අතර, මහා භාරකාරවරයා යටත් වන වගකීම් වලට ම ඔහු ද යටත් විය යුතු ය.

(4) මේ ආඥාපනත පරිපාලනය කිරීමෙහි ලා මහා භාරකාරවරයාට හෝ යම් නියෝජ්‍ය මහා භාරකාරවරයකුට සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි යම් නීති නිලධරයන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය පත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 10අ වගන්තිය වශයෙන් බලපැවැත් විය යුතු ය:—

"සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යන යම් ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් ඔහුගේ මරණය සිදුවූ අවස්ථාවක වන්දි ගෙවනු ලැබිය යුතු තැනැත්තන් නම් කළ යුතු බව.

10අ. (1) සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යන යම් ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් එසේ සේවා නියුක්තියෙහි යෙදී සිටිය දී ඔහුගේ මරණය සිදු වූ අවස්ථාවක, යම් වන්දියක් ගෙවනු ලැබිය යුතු තැනැත්තන්ගේ නම් මහා භාරකාරවරයා වෙත ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකාවෙන් බැහැර සේවා නියුක්තියෙහි යෙදී සිටිය දී යම් ශ්‍රී ලාංකික පුරවැසියකු මියයන අවස්ථාවක, ඒ මරණය සම්බන්ධයෙන් වන්දි වශයෙන් ගෙවිය යුතු යම් මුදලක්, ඊට හිමිකම් ලබන තැනැත්තන්ට මහා භාරකාරවරයා විසින් ගෙවනු ලැබීම පිණිස, ඔහුගේ සේවායෝජකා විසින් මහා භාරකාරවරයා වෙත යවනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් මුදලක් ලැබුනු විට ඒ මුදල, (1) වන උපවගන්තිය යටතේ මියගිය තැනැත්තා විසින් නම් කරනු ලැබූ තැනැත්තාට හෝ එවැනි නම් කිරීමක් නොමැති අවස්ථාවක, ඊට හිමිකම් ලබන තැනැත්තන්ට මහා භාරකාරවරයා විසින් බෙදා දෙනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 25අ හා 25ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 25අ හා 25ආ වගන්ති වශයෙන් බලපැවැත් විය යුතු ය:—

"මහා භාරකාරවරයා විසින් දේපළක තාවකාලික සන්තකය ප්‍රදානය කරන ලෙස ඉල්ලුම් කිරීම.

25අ. (1) මහා භාරකාරවරයා විසින් මියගිය තැනැත්තාගේ බුදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර සඳහා ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක, මහා භාරකාරවරයා විසින් ඒ හා සමගම, බුදලයේ චංචල හා නිශ්චල දේපළ සම්බන්ධයෙන් තාවකාලික සන්තකය ලබා ගැනීමට ඔහුට බලය දෙන (මේ වගන්තියෙහි "තාවකාලික සන්තකය සඳහා වූ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් සඳහා ද ඉල්ලුම් කළ හැකි ය.

(2) බූදලයක් සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර නිකුත් කිරීම සඳහා මහා භාරකාරවරයා විසින් කරනු ලබන ඉල්ලීමෙහි දී අධිකරණය විසින් නයිසයි ආඥාවක් සටහන් කරනු ලබන අවස්ථාවේ දී, ඒ බූදලය සම්බන්ධයෙන් තාවකාලික සන්තකය සඳහා වූ ආඥාවක් අධිකරණය විසින් යම් අවස්ථාවක ඒ නයිසයි ආඥාව අස් කරනු ලබන්නේ නම්, අධිකරණය විසින් තාවකාලික සන්තකය සඳහා වූ ආඥාව ද අවලංගු කරනු ලැබිය යුතු ය.

(3) තාවකාලික සන්තකය සඳහා වූ ආඥාවක් ප්‍රකාර මියගිය තැනැත්තාගේ බූදලයේ චංචල හා නිශ්චල දේපළ සන්තකය මහා භාරකාරවරයා විසින් ලබා ගන්නා අවස්ථාවක, ඔහු විසින් ඒ දේපළ, බූදලයේ උරුමක්කාරයන් වෙනුවෙන් භාරයක් වශයෙන් දරනු ලැබිය යුතු ය.

මහා භාරකාරවරයාට, රැකවරණ භාරකරු වශයෙන් නඩු පැවරීමට බලය තිබිය යුතු බව.

25අ. මහා භාරකරු රැකවරණ භාරකරු වශයෙන් පත් කරනු ලැබ ඇත්තේ යම් භාරයක ද, ඒ භාරයේ කළමනාකාර භාරකරු වෙත පැවරී ඇති කළමනාකාර බලතල හෝ වෙනත් යම් අභිමතානුසාරී බලයක් ක්‍රියාත්මක කිරීමෙහි දී, ඔහු විසින් ඒ භාරය කඩ කිරීමක් සිදු කොට ඇති බව විශ්වාස කිරීමට මහා භාරකාරවරයාට හේතු ඇති අවස්ථාවක, භාරයේ මූළ විෂය කාරණයම හෝ එයින් යම් කොටසක් හෝ අයිතිව තිබෙන්නේ හෝ පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණයක සිවිල් අධිකරණ බලයේ ප්‍රාදේශීය සීමාව ඇතුළත ද ඒ දිසා අධිකරණයෙහි—

(අ) යම් භාරකරුවකු ඉවත් කරන ලෙස විධාන කරන;

(ආ) ගිණුම් ඉදිරිපත් කරන ලෙස හා විභාග පවත්වන ලෙස විධාන කරන;

(ඇ) භාර දේපළේ හෝ එයින් උපචිත වන පොලියේ කවර අනුපාතයක් භාරයෙහි යම් විශේෂ අරමුණක් සඳහා වෙන් කරනු ලැබිය යුතු දැයි ප්‍රකාශ කරන;

(ඈ) මූළ භාර දේපළට හෝ එයින් යම් කොටසක් හෝ කුලියට දීමට, විකිණීමට, උකස් කිරීමට හෝ හුවමාරු කිරීමට බලය දෙන;

(ඉ) භාරය කළමනාකරණය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් නියම කරන:

(ඊ) යම් භාරකරුවකු විසින් යම් ක්‍රියාවක් එසේම ඉටු කරන ලෙස විධාන කරන;

(උ) මහා භාරකාරවරයා තනි භාරකාරවරයා ලෙස පත් කරන; සහ

(ඌ) අවස්ථානුකූලව අවශ්‍ය විය හැකි වෙනත් යම් හෝ වැඩිදුර සහන ප්‍රදානය කරන තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා මහා භාරකාර වරයා විසින් නඩුවක් පවරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය ප්‍රතිශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

" මහා භාරකාර වරයා විහාරස්ථ දේපළෙහි භාරකරු විය හැකි බව.

49. (1) විහාර දේවාලගම් ආඥාපනතේ පට හැනිව කුමක් සඳහන් වුව ද, මහා භාරකාරවරයා විසින්—

(අ) විහාරස්ථානයක යහපත පිණිස භාරයක් වශයෙන් චංචල දේපළ දරනු ලැබිය හැකි ය. එවැනි යම් දේපලකින් ලැබෙන ආදායම, ආඥාපනතේ 20 වන වගන්තියට අනුකූලව ඒ විහාරස්ථානයේ භාරකරු හෝ පාලන විහාරාධිපතිවරයා සතු විය යුතු ය;

(ආ) අක්කර විස්සක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් යුතු නිශ්චල දේපළක් වන විහාරස්ථානයක භාරකරු හෝ පාලක විහාරාධිපතිවරයා සතු යම් නිශ්චල දේපළක් මහා භාරකාරවරයා සහ ඒ භාරකරු හෝ පාලක විහාරාධිපතිවරයා හෝ විසින් එකඟවනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත කළමනාකරණය කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියෙහි "භාරකරු", "පාලක විහාරාධිපතිවරයා" සහ "විහාරස්ථානය" යන යෙදුම්වල බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ ඒ සඳහා පිළිවෙළින් දී ඇති අර්ථ ම ඇත්තේ ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක ක්‍රියාත්මක විය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඊ) වීති නියම කරනු ලැබිය යුතු යයි මේ ආඥාපනත මගින් නියමිත කාරණා.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 ද. **(විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම** දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.